වෙළඳ අනුපාතයෙහි වර්ධනය හේතු කොට ගෙන විදේශ සම්පත් පරතරය 1976 දී වි. හැ. අ. දශ ලක්‍ෂ 252 සිට 1977 දී වි. හැ. අ. දශ ලක්‍ෂ 92 දක්වා අඩුවිය. මෙම හිඟය පියවීමේ දී සංඛ්‍යා සටහනින් දැක්වෙන පරිදි 1977 දී වි. හැ. අ. දශ ලක්‍ෂ 261 ක විදේශ සම්පත් ලබා ගන්නා ලද අතර, එය වි හැ. අ. දශ ලක්‍ෂ 169 ක විදේශ වත්කම් ඉහළ යාමකට හේතු විය දිගුකාලීන ණය සහ පරිත්‍යාග වි. හැ. අ. දශ ලක්‍ෂ 14 කින් වැඩි වූ අතර කෙටිකාලීන ණය ගැනීම් වි හැ. අ. දශ ලක්‍ෂ 96 කින් තියුණු ලෙස අඩුවෙමින් 1977 දී දිගුකාලීන ණය ගැනීම් සඳහා වැඩි රුදියාවක් පෙන්නුම් කෙරිනි. රුපියල් දශ ලක්‍ෂ 1,680 ක් වන අගැයීම් ගැලපිලි අනුව විදේශ වත්කම්වල වැඩිවීමෙන් සියයට 30 ක් පමණ දේශීය හා ජාත්‍යන්තර මුදල් වල වටිනාකම් වෙනස්වීමෙන් සිදු වූ බව පෙනේ.

නො පියවන ලද මුලු විදේශීය ණය ප්‍රමාණය 1976 දී රුපියල් දශ ලක්‍ෂ 6,826 සිට 1977 දී රුපියල් දශ ලක්‍ෂ 13,321 දක්වා දෙගුණයකටත් වඩා වැඩිවිය. මීට පෙර නොවූ මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ විනිමය අනුපාතික වෙනස්කමය. වි. හැ. අ ඒකක අනුව ගණනය කරන විට විදේශ ණය වි. හැ. අ. දශ ලක්‍ෂ 666 සිට වි. හැ. අ. දශ ලක්‍ෂ 705 දක්වා සියයට 6 ක වැඩිවීමක් පමණක් පෙන්නුම් කරයි. විදේශ ණය සේවා අනුපාතය (එනම්, ණය ආපසු ගෙවීම් සහ පොලී ගෙවීම්, මුලු විදේශීය ඉපයීම් වල අනුපාතයක් ලෙස ගණන් ගැනීම) 1976 දී සියයට 20·1 සිට 1977 දී සියයට 18·5 දක්වා අඩු විය.

ශ්‍රී ලංකාවේ රුපියලෙහි අගය 1977 දී නිරතුරුවම වෙනස් විය. 1977 මුල දී ශ්‍රී ලංකා රුපියල ජාත්‍යන්තර මුදල් වර්ග කිහිපයකට ඈඳා තිබූ අතර, මාර්තු මුල දී විනිමය අනුපාතිකය ඇමෙරිකා එක්සත් ජනපද ඩොලරයක් රුපියල් 8·72 ක් විය. මාර්තු මස 12 වන දින රුපියල දළ වශයෙන් සියයට 20 කින් ප්‍රති අගය කරන ලද අතර, ඒ අනුව විනිමය අනුපාතිකය ඇ. එ ජ. ඩොලරයක් රුපියල් 7·28 ක් විය. එසේ වුව ද, මෙම සංශෝධනය සනාථ කරන පරිදි ගෙවුම් තුලනයෙහි මූලික දිගුකාලීන වර්ධනයක් පෙනෙන්නට නොතිබුණි. අගෝස්තු වන විට මෙම තත්ත්වය නිවැරදි කිරීමට නව රජය විසින් තීරණය කරන ලද අතර, ඒ අනුව නොවැම්බර් 15 වන දින දක්වා රුපියලේ අගය ක්‍රමානුකූලව අඩුවීමට ඉඩ හරින ලදී. එම දිනයේ දී නිල විනිමය අනුපාතිකය සහ අතිරේක විනිමය අනුපාතිකය (විවිහිස) ඒකාබද්ධ කරන ලද අතර, ආරම්භයේ දී රුපියලේ වටිනාකම ඇ. එ. ජ. ඩොලරයක් රුපියල් 16 ක් ලෙස නියම කරන ලදී. ඉන්පසු, වෙළඳ පොල අනුව වටිනාකම නියමවන සැටියට රුපියල පාවීමට ඉඩහරින ලදී. වෙළෙඳ බැංකුවල තැන් මිලදී ගැනීමේ හා විකිණීමේ අනුපාතිකයන් දිනපතා පැවැත්වෙන බැංකු කරුවන්ගේ රැස්වීමක දී තීරණය කරනු ලැබේ. මෙම ක්‍රමය ආරම්භයේ දී ඇ. එ. ජ. ඩොලරයක මිලදී ගැනීමේ හා විකිණීමේ අනුපාතිකයන් පිළිවෙලින් රුපියල් 15·97 ක් හා රුපියල් 16·03 ක් විය. දෙසැම්බර් අවසානය වන විට මෙම අනුපාතිකයන් ඩොලරයක් රුපියල් 15·53 ක් හා රුපියල් 15·59 ක් වශයෙන් වෙනස්වී තිබුණි.

## රජයේ මුදල් පරිහරණය

1977 දී රජය තම මුදල් පරිහරණ කටයුතු මගින් රටේ ආර්ථික ක්‍රියාවලියට රුපියල්, දශලක්‍ෂ 716 ක සංකෝචනාත්මක බලපෑමක් ඇතිකර ඇත. පසුගිය වර්ෂ දෙකේදීම එනම් 1976 දී රුපියල්දශ ලක්‍ෂ 605 කින් සහ 1975 දී රුපියල් දශලක්‍ෂ 184 කින් කරන ලද උද්ධමනකාරි මූල්‍යකරනයකින් පසුව ඇතිවූ මෙම බලපෑම, මිල මට්ටම පහළ හෙලීමට තුඩු දුන් බව නිසැකවම කිව හැකිය. වෙන් කර තිබූ මුදල් වැය නොකිරීම මගින්, උද්ධමනය අඩු කරවන සහනදායි බලපෑමක් ඇති කිරීම, අගය කරන අතරම, එයට මග පෑදූ, වෙන්කළ ප්‍රාග්ධන වියදම්වල අසතුටු දායක උපයෝජනය පිළිබඳවද සඳහන් කළ යුතුමය.

රජයේ වියදම් පිළිබඳ තාවකාලික සංඛ්‍යා සැසඳීමේදී ඉහත වර්ෂයට වඩා සියයට 4 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. 1970 සිට සිදුවී ඇති සියයට 16 ක සාමාන්‍ය වාර්ෂික වැඩිවීමත් සමග සසඳන කල මෙම වැඩිවීම ආන්තික වැඩිවීමකි. 1977 දී වියදම් අඩුවීම ප්‍රාග්ධන වැය අඩුවීමකට පමණක් සීමා විය. පුනරාවර්තන වියදම් සියයට 11 කින් වැඩිවී ඇතත්, එය

## 14 වැනි සංඛ්‍යා සටහන

## රාජ්‍ය මුදල් පරිහරණය – 1974/1978

රුපියල් දශලක්ෂ

| ශීර්ෂය | 1974 | 1975 | 1976 | 1977 අනුමත කළ ඇස්තමේන්තු | 1977 තාවකාලික | 1978 අනුමත කළ ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|
| 1. ආදයම[1] | 4,787 | 5,084 | 5,739 | 6,062 | 6,686 | 10,830 |
| 2. පුනරාවර්තන වියදම | 4,500 | 5,159 | 5,554 | 5,888 | 6,148 | 9,972[4] |
| 3. අත්තිකාරම් ගිණුම් කටයුතු (හිඟය – / අතිරික්තය +) | – 39 | – 73 | – 312 | — | – 350 | – 100 |
| 4 වර්තන ගිණුම (+ අතිරික්තය / හිඟය –) | + 242 | – 142 | – 128 | + 174 | + 188 | + 758 |
| 5. ප්‍රාග්ධන වියදම | 1,841 | 2,556 | 3,448 | 2,904 | 3,210 | 5,181[4] |
| ඉන් නිදන් අරමුදල සහ ක්‍රමක්ෂය ගෙවීම සහ ජාත්‍යන්තර සංවිධාන වලට දයක දීමනා | (564) | (596) | (662) | (848) | (947) | (1,092) |
| 6. අය වැය හිඟය | 1,599 | 2,699 | 3,576 | 2,730 | 3,022 | 4,423 |
| 7. හිඟය පියවීම | | | | | | |
| 7.1 දේශීය මූල | 910 | 1,610 | 2,284 | 1,370 | 1,779 | 1,603 |
| (අ) බැංකු නොවන වෙළෙඳ පොළ ණය | 976 | 1,075 | 1,160 | 1,300 | 1,504 | 1,750 |
| (ආ) වෙළෙඳපොළ නොවන ණය | – 54 | 379 | 485 | 70 | 499 | – 147 |
| (ඇ) බැංකු ක්‍රමය[2] | – 12 | 156 | 639 | — | – 224 | — |
| 7.2 විදේශීය මුදල් | 650 | 1,059 | 1,326 | 1,350 | 1,736 | 2,820 |
| (අ) යෝජනාක්‍රම ණය | 79 | 275 | 327 | ලැ. නො. | 368 | ලැ. නො. |
| (ආ) ද්‍රව්‍ය ණය | 319 | 380 | 633 | ලැ. නො. | 885 | ලැ. නො. |
| (ඇ) දීමනා | 252 | 404 | 367 | ලැ. නො. | 483 | ලැ. නො. |
| 7.3 මුදල් ශේෂ ප්‍රයෝජනයට ගැනීම | 39 | 31 | – 33 | 10[3] | – 492 | ලැ. නො. |
| 8. රාජ්‍ය මුදල් කටයුතුවල ප්‍රසාරණාත්මක බලපෑම | 24 | 184 | 605 | 10 | – 716 | — |

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව. සහ මහ භාණ්ඩාගාරය

1. විදේශීය දීමනා යටතේ ඇති ප්‍රාග්ධන දීමනා ආදයමෙහි ඇතුළත් කර නැත.
2. ජාත්‍යන්තර මූල්‍ය සංවිධානවලට දයක දීමනා ලෙස, මහ බැංකුවෙන් කෙරුන විශේෂ අත්තිකාරම් ඇතුළත්ය.
3. කාරක සභා අවස්ථාවේදී සංශෝධනය කරන ලද පරිදි දුම්රිය සේවා වියදම් රුපියල් දශ ලක්ෂ 10 කින් වැඩිවීම නිසාය.
4. කාරක සභා අවස්ථාවේදී කළ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සංශෝධන පිළිවෙලින් රුපියල් 17 ලක්ෂයක් හා රුපියල් 8 ලක්ෂයද ඇතුළත්ය.

දළ ජාතික නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස දක්වන විට 1976 දී වූ සියයට 24, 1977 දී සියයට 21 දක්වා අඩුවී ඇති බව පෙන්නුම් කරයි. අනෙක් අතට 1977 දී ප්‍රාග්ධන වියදම සියයට 19 කින් අඩුවී ඇති අතර, එය දළ ජාතික නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන් දක්වන විට, 1976 දී වූ සියයට 12, 1977 දී සියයට 8 දක්වා අඩුවී ඇත.

මැතිවරණ වර්ෂයකදී, රාජ්‍ය කටයුතු පිළිබඳව සාමාන්‍යයෙන් දක්නට ලැබෙන සුපරීක්ෂාකාරී භාවය නොමැතිවීම සහ ආණ්ඩු වෙනස් වීමේදී ඇතිවන තාවකාලික පරිපාලන අවුල් සහගත භාවය, 1977 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් අඩුවීමට හේතු වන්නට ඇත. මෑත අතීතයේ සියයට 19 ත් සියයට 25 ත් අතර වූ ප්‍රාග්ධන අරමුදල් ඌන වියදම් ප්‍රමාණය 1976 දී සියයට 9 දක්වා අඩුවූ අතර, 1977 දී එය සියයට 27 තෙක් වැඩිවී ඇත.

1977 දී රජයේ ආදායමේ වර්ධනයක් දක්නට ලැබේ. තේ සහ රබර් මිල ගණන් නොකඩවා වැඩිවෙමින් පැවතීම නිසා ඇතිවූ අපනයන බදු මුදල් වැඩිවීම, මෙයට ප්‍රධාන හේතුව විය. ආදායම, දළ ජාතික නිෂ්පාදිතයට දරණ අනුපාතය සියයට 23 ක් වූ අතර, මෙය ඉහත වර්ෂයට වඩා ආන්තික පසුබෑමක් පිළිබිඹු කරයි.

1977 දී වර්තන ගිණුමේ සමස්ථ ක්‍රියාකාරිත්වය (රජයේ ආදායමේ හා පුනරාවර්තන වියදම අතර වෙනස) සලකා බලන විට රුපියල් දශලක්ෂ 188 ක අතිරික්තයක් දක්නට ලැබිණ. පසුගිය වර්ෂ දෙකේදීම මෙහි හිඟයන් සටහන් විය.

1977 වර්ෂයේ රාජ්‍ය මුදල් කටයුතුවල සාරාංශය හා 1978 වර්ෂය සඳහා අනුමත කළ ඇස්තමේන්තු 14 වැනි සංඛ්‍යා සටහනෙහි පෙන්නුම් කර ඇත. නිදහස් අරමුදල් හා ණය ආපසු ගෙවීමෙන් ණය ගැනීම් වලට ඇතිවන බලපෑම ඉවත්කොට සකස් කරන ලද රජයේ ශුද්ධ මුදල් හිඟය III වැනි පරිශිෂ්ඨයේ 9 වැනි සංඛ්‍යා සටහනෙහි ඉදිරිපත් කර ඇත.

**වියදම**

තාවකාලික සංඛ්‍යා වලට අනුව 1977 රජයේ මුළු වියදම රුපියල් දශලක්ෂ 9,708 ක් විය. මෙය සමන්විත වූයේ රුපියල් දශලක්ෂ 6,148 ක් වූ පුනරාවර්තන වියදම් ද, රුපියල් දශලක්ෂ 2,263 ක් වූ ශුද්ධ ප්‍රාග්ධන වියදම් ද, රුපියල් දශලක්ෂ 947 ක්වූ නිදහස් අරමුදලට දායක දීමනා හා ණය ආපසු ගෙවීම් ද සහ රුපියල් දශලක්ෂ 350 ක් වූ අත්තිකාරම් ගිණුම් යටතේ වූ ශුද්ධ ආපසු ගෙවීම් ද වලිනි.

රුපියල් දශලක්ෂ 6,148 ක් වූ පුනරාවර්තන වියදම ඉහත වර්ෂයට වඩා සියයට 11 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. නඩත්තු අවශ්‍යතාවයන්ගේ මිල ඉහළයාම, රාජ්‍ය සේවයට අළුතින් සේවකයන් බඳවාගැනීම, අළුත් ප්‍රාග්ධන කටයුතුවලට ඈදී එන පුනරාවර්තන වියදම, රාජ්‍ය සේවකයන්ගේ පෞද්ගලික දීමනාවන් ඉහළයෑම සහ රාජ්‍ය ණය සේවා කරන වියදම ඉහළයාම ඉහතකී වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතුවී ඇත. මෙම වැඩිවීම් පැහැදිලිව දක්නට ලැබෙන්නේ, මුදල් (රුපියල් දශලක්ෂ 109 කින්) අධ්‍යාපන (රුපියල් දශලක්ෂ 83 කින්) සෞඛ්‍ය (රුපියල් දශලක්ෂ 56 කින්) කර්මාන්ත හා විද්‍යා කටයුතු (රුපියල් දශලක්ෂ 39 කින්) සහ වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග (රුපියල් දශලක්ෂ 14 කින්) යන අමාත්‍යාංශ වලය. කෙසේ වෙතත් රුපියල් දශලක්ෂ 399 ක පරිපූරක වෙන්කිරීම්ද ඇතුලත් රුපියල් දශලක්ෂ 6,406 ක දළ වෙන් කිරීම සමග සැසඳූ කල සියයට 4 ක ඌන උපයෝජනයක් තිබූ බව පෙනියයි. III වැනි පරිශිෂ්ඨයේ 12 වැනි සංඛ්‍යා සටහනින් එක් එක් අමාත්‍යාංශය යටතේ රජයේ වියදම බෙදීයන අයුරු දැක්වෙයි.

1977 ශුද්ධ ප්‍රාග්ධන වියදම රුපියල් දශලක්ෂ 523 කින් එනම් සියයට 19 කින් 1976 වර්ෂයට වඩා අඩුවීමක් වාර්තා වෙයි. 1976 දී ඊට ඉහත වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 826 ක එනම් සියයට 42 ක තියුණු වැඩිවීමක් දක්නට ලැබිණි. ඇත්තවශයෙන්ම 1976 වර්ෂය අසාමාන්‍ය වර්ෂයක් වූයේ නොබැඳි ජාතීන්ගේ සමුළුව සඳහා කඩිනමින් කළ පිළියෙල කිරීම් අතර අපර්ව්‍යුහ පහසුකම් සංවර්ධන කටයුතු ද අති සීඝ්‍ර කිරීමට සිදුවූ නිසාය. ණය ආපසු ගෙවීම් හා නිදහස් අරමුදල් දායක ගෙවීම් ඉවත් කළ විට 1977 දී නියම සංවර්ධන

කටයුතු වියදම රුපියල් දශලක්‍ෂ 2,263 ක් විය. රුපියල් දශලක්‍ෂ 354 ක පරිපූරක වෙන් කිරීම් ද ඇතුලත් දළ වෙන්කිරීම වන රුපියල් දශලක්‍ෂ 3, 103 හා සලකා බලන විට මෙම හිඟය සියයට 27 ක ඌන උපයෝජනයක් පිළිබිඹු කරයි.

ඉහත වර්ෂයේ නියත ප්‍රාග්ධන වියදම සමග සසඳන කල 1977 දී වාරිමාර්ග, විදුලිබල හා මහා මාර්ග (රුපියල් දශලක්‍ෂ 139 කින් ද) වැවිලි කර්මාන්ත (රුපියල් දශලක්‍ෂ 104 කින්ද) පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් (රුපියල් දශලක්‍ෂ 69 කින් ද) සමාජ සේවා (රුපියල් දශලක්‍ෂ 57 කින් ද) යන අමාත්‍යාංශවල සැලකියයුතු වියදම් අඩුවීමක් පෙනෙයි. පෙර වර්ෂ වල මෙන්ම මෙම වර්ෂයේද අපර්වයූහ සංවර්ධන කටයුතු සඳහා වියදමෙන් වැඩි කොටසක් වැයවී ඇත. වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග යටතේ රුපියල් දශලක්‍ෂ 413 ක ආයෝජන-යක් ද, කෘෂිකර්ම හා ඉඩම් සංවර්ධනය සඳහා රුපියල් දශලක්‍ෂ 341 ක් ද, ප්‍රවාහන කටයුතු සඳහා රුපියල් දශලක්‍ෂ 208 ක හිමිකම් පෑමක් ද, තැපැල් හා විදුලි සංදේශ රුපියල් දශලක්‍ෂ 198 ක උපයෝජනයක් ද, පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් වියදම් සඳහා රුපියල් දශලක්‍ෂ 127 ක් ද, නාවික හා සංචාරක කටයුතු සඳහා රුපියල් දශලක්‍ෂ 32 ක් ද වැයවී ඇත. අනෙක් අතට නිෂ්පාදන කර්මාන්ත වැඩි කොටසක් පිළිබඳව කටයුතු කරන, කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශය රුපියල් දශලක්‍ෂ 519 ක වියදමක් දරා ඇත.

1977 තුළදී අත්තිකාරම් ගිණුම් යටතේ වූ ශුද්ධ ගෙවීම් රුපියල් දශලක්‍ෂ 350 ක් වූ අතර ඉකුත් වසරේදී එම ගෙවීම් රුපියල් දශලක්‍ෂ 312 ක් විය. මෙම වර්ෂයේ ශුද්ධ ගෙවීම් මූලික වශයෙන් රජයේ දෙපාර්තමේන්තු අත්තිකාරම් සඳහා වූ රුපියල් දශ ලක්‍ෂ 153 කින් ද, රාජ්‍ය සංස්ථා වෙනුවෙන් වූ රුපියල් දශලක්‍ෂ 95 කින් ද, රබර් මිලදී ගැනීම සඳහා වූ චීන-ලංකා වෙළඳ ගිවිසුම සඳහා රුපියල් දශලක්‍ෂ 43 කින් ද සමන්විත විය. මෙම අත්තිකාරම් ගිණුම් වල මෑත වර්ෂවලදී දක්නට ලැබුණු විශාල ගෙවීම් ප්‍රමාණය රාජ්‍ය මූල්‍ය කටයුතුවල අස්ථිර-තාවයක් බිහිකර ඇත. එමනිසා සාමාන්‍ය අය වැය කටයුතු ක්ෂෙත්‍රයට අදල කර ගතහැකි අන්දමට අත්තිකාරම් ගිණුම් ක්‍රියාවලිය නැවත සලකා බැලීම පිළිබඳව, රජයේ ඉක්මන් අවධානය යොමු විය යුතු බව පෙනේ.

**ආදායම**

තාවකාලික සංඛ්‍යා අනුව 1977 රජයේ ආදායම රුපියල් දශලක්‍ෂ 6686 ක් විය. මෙය ඉහත වර්ෂයට වඩා සියයට 17 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. 1977 යහපත් ක්‍රියාකාරිත්වයට ප්‍රධාන වශයෙන් හේතුවූයේ ඉතා සතුටුදායක නිර්යාත භාණ්ඩ මිල ගණන් සහ සාපේක්‍ෂ වශයෙන් ආයාතයන්ගේ වටිනාකම වැඩිවීමය. සැලකියයුතු ප්‍රමාණයකින් ඉහල ගිය ආදායම් කාණ්ඩ අතුරෙන් තේ බද්ද (රුපියල් දශලක්‍ෂ 299 ක්) අපනයන බදු (රුපියල් දශලක්‍ෂ 199 ක්) රාජ්‍ය සංස්ථා ලාභ (රුපියල් දශලක්‍ෂ 178 ක්) දුම්කොළ බද්ද (රුපියල් දශලක්‍ෂ 139 ක්) සහ ව්.ව්.හි.ස. (රුපියල් දශලක්‍ෂ 83 ක් ද) ප්‍රධාන වේ. සංස්ථාපිත හා පෞද්ගලික ආදායම් බදුවල දියුණුවක් දක්නට නොතිබුණ අතර පිරිවැටුම් බදු රුපියල් දශලක්‍ෂ 39 කින් අඩුවීමක් වාර්තා විය. රජයේ ආදායම පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවක් III සංඛ්‍යා ලේඛන පරිශිෂ්ඨයේ 11 වැනි සංඛ්‍යා සටහනින් දැක්වෙයි.

ඉතා හොඳින් පැවති තේ මිලෙන් වැඩි කොටසක් රජයේ ආදායමට දයක කර ගැනීම සඳහා 1977 වර්ෂය තුලදී තෙවරක්ම (මාර්තු, මැයි හා නොවැම්බරයේදී) තේ කර්මාන්තයට අදල බදු අනුපාත සංශෝධනය කරන ලදී. මාර්තු සහ මැයි යන මාසවලදී තේ සඳහා වූ වටිනාකම අනුව අය කෙරෙන බද්ද වැඩි කරන ලදී. කෙසේ වෙතත් නොවැම්බරයේ කරන ලද සංශෝධනයෙන් බලාපොරොත්තු වූයේ නියම තේ බද්ද මගින් පටවා තිබූ බර වෙනස්කර, විනිමය අනුපාතිකය ඒකීය කිරීමෙන් වැඩිවූ නිර්යාත මිලෙන් සැලකිය යුතු කොටසක් ආපසු ගැනීමය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් විශේෂ තේ නිර්යාත බද්ද කිලෝ ග්‍රෑම් 1 ට ශත 86 සිට රුපියල් 15·50 දක්වා, සැලකියයුතු ප්‍රමාණයකින් වැඩි කෙරුණු අතර ඉහත වර්ෂයට වඩා වැඩියෙන් ලැබී ඇති අපනයන බදු ආදායම වන රුපියල් දශලක්‍ෂ 113 ම1977 දෙසැම්බර් මාසය තුල එකතුවී ඇත.

එලෙසම, විනිමය අනුපාතිකය ඒකියකරනයෙන් ඇතිවන මිල වාසිය ඉවත් කිරීම සඳහා, රබර් නිර්යාත මත පනවා තිබූ, ක්‍රමානුකූලව අඩු වැඩි වන පරිමානයේ බද්ද නොවැම්බර් මාසයේදී වැඩි කරන ලදී. කෙසේ වෙතත් රුපියල් දශලක්ෂ 63 ක් වූ රබර් නිර්යාත මගින් ලැබුණු වැඩි ආදයම් ප්‍රමාණයට මූලික වශයෙන්ම හේතුවී ඇත්තේ වසර ආරම්භයේ පැවතුන ඉහල මිල ගණන්ය. 1975 නොවැම්බර් මස ඉවත් කළ පොල් නිෂ්පාදන අපනයන බද්ද විනිමය අනුපාතිකය ඒකියකරනයත් සමග නැවතත් හඳුන්වා දෙන ලදී. නමුත් මෙම බද්ද 1977 ආදයම කෙරේ සැලකිය යුතු බලපෑමක් ඇති නොකළේය.

රාජ්‍ය සංස්ථාවල ලාභ හා ලාභාංශවල වැඩිවීම්කෙරේද, අපනයන වලට ලැබුණ වඩා හොඳ මිළ ගණන් හේතු විය. ජනවසම සහ රාජ්‍ය වැවිලි සංස්ථාවේ අපනයන ඉපයීම් අතිරික්තය (රුපියල් දශලක්ෂ 240) 1971 අංක 38 දරණ මුදල් පනතේ විධානයන් යටතේ, රජයේ ආදයමට විසර්ජනය කෙරුනි. 1977 දී කිප විටක්ම දුම්කොළ ද්‍රව්‍ය නිෂ්පාදනයේ ඇනයීවීම් ඇති වුවත් දුම්කොල බදු ආදයම වැඩිවීමට ඉහත වර්ෂයේ සිට පැනවූ ඉහල දුම්කොල බද්ද (රාත්තල් 1 කට රුපියල් 77) හේතු විය. මෑත වර්ෂවල එකම ශීර්ෂයක් යටතේ රජයේ ආදයමට වැඩිම ආදයමක් ලැබී ඇත්තේ විවිහිස විකිණීමෙනි. විවිහිස ක්‍රමය නොවැම්බර් මස ඉවත් කළද එයින් ඇතිවන ආදයමේ අඩුව ආනයන හා අපනයන බදු වැඩි කිරීම මගින් සමහන් වනු ඇත.

**අයවැය හිඟය පියවීම**

තාවකාලික සංඛ්‍යා අනුව 1977 සමස්ථ අය වැය හිඟය රුපියල් දශලක්ෂ 3,022 කි. මුල් ඇස්තමේන්තු වලට වඩා රුපියල් දශලක්ෂ 292 ක වැඩිවීමක් මෙමගින් පෙන්නුම් කරයි. දේශීය වශයෙන් රුපියල් දශලක්ෂ 1,779 ක් ද, විදේශීය මූලාශයන්ගෙන් රුපියල් දශලක්ෂ 1,736 ක් ද ලබාගැනීමෙන් රජය මෙම හිඟය පියවන ලදී. මූල්‍යනය කළයුතු ප්‍රමාණයට වඩා වැඩියෙන් ඇති රුපියල් දශලක්ෂ 716 න් කොටසක් (රුපියල් දශලක්ෂ 224 ක්) බැංකු ණය කපාහැරීම සඳහා යොදවා ඇත. ඉතිරිය වූ රුපියල් දශලක්ෂ 492 න් රජයේ මුදල් ශේෂ වැඩි විය. භාණ්ඩාගාරයේ වාර්තා අනුව මේ මගින්, රජයේ ප්‍රතිපාර්ශවීය අරමුදල් රුපියල් දශලක්ෂ 355 කින් වැඩිකර ගැනීමටද, භාණ්ඩාගාර මුදල් ශේෂ රුපියල් දශලක්ෂ 137 කින් වර්ධනය කර ගැනීමටද හැකි විය.

බැංකු නොවන වෙළඳපොල මූලාශ්‍රයන්ගෙන් රුපියල් දශලක්ෂ 1,504 කින් හා වෙළඳ පොල නොවන පරිපාලන ණය ගැනීම් මගින් ලත් රුපියල් දශලක්ෂ 499 කින්, දළ දේශීය ණය ගැනීම වූ රුපියල් දශලක්ෂ 1,779 සමන්විත විය. වෙළඳපොල ණය ගැනීම් අතර ප්‍රධාන මූලාශ්‍රය වූයේ රුපියල් සුරැකුම්පත් විකිණීමයි. ඉන් සියයට 95 ක්ම නිල ආයතන (එනම් ජාතික ඉතිරිකිරීමේ බැංකුව, සේවක .අර්ථසාධක අරමුදල, රක්ෂණ සංස්ථාව සහ රාජ්‍ය ණය නිදන් අරමුදල්) ඉතුරුම් මගින් ලැබුණ දයක මුදල් විය.

රුපියල් දශලක්ෂ 1,736 ක් වූ, වර්ෂය තුල ලැබුණ විදේශ ආධාර රුපියල් දශලක්ෂ 885 ක භාණ්ඩ ණය ද, රුපියල් දශලක්ෂ 368 ක යෝජනා ක්‍රම ණය ද, රුපියල් දශලක්ෂ 483 ක දීමනාවලින් ද සමන්විත විය.

**රාජ්‍ය ණය**

1977 දෙසැම්බර් මාසයේදී මුළු රාජ්‍ය ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 24,986 ක් වූ අතර එය පසුගිය වසරට වඩා සියයට 42 ක හෙවත් රුපියල් දශලක්ෂ 7,327 ක වර්ධනයක් පෙන්නුම් කළේය සම්පූර්ණ දේශීය ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 14,159 ක් වූ අතර, ඉතිරිය වූ රුපියල් දශලක්ෂ 10,827 මගින් විදේශීය ණය ප්‍රමාණය නියෝජනය කළේය. දේශීය රුපියල් ණය හා සම්බන්ධිත නිදන් අරමුදලේ වටිනාකම රුපියල් දශලක්ෂ 2,552 ක් විය.

දේශීය ණය රුපියල් දශලක්ෂ 1,468 කින් ඉහළ ගියේය. ප්‍රධාන ඉහළයෑම් අතරට, දශලක්ෂ 1,500 ක මධ්‍යකාලීන රුපියල් සුරැකුම් නිකුතුව හා සමහර අර්ධ රාජ්‍ය ආයතන මගින් ලබාගන්නා ලද විදේශීය ණය දෙකක වටිනාකම වෙනුවෙන් රුපියලේ අගය ක්ෂයවීම උදෙසා කරනලද රුපියල් දශලක්ෂ 270 ක පොත් ගැලපුම ද ගැනේ. අනික් අතට රජය විසින්

රුපියල් දශලක්ෂ 200 ක භාණ්ඩාගාර බිල්පත් සඳහා මුදල් ගෙවූ අතර, රුපියල් දශලක්ෂ 110 ක් වටිනා කල්පිරුණු රුපියල් ණය ආපසු ගෙවන ලදී. රජය විසින් ලබාගත් ශ්‍රී ලංකා මහ බැංකු අත්තිකාරම් රුපියල් දශලක්ෂ 17 කින් ඉහළ ගිය අතර, බදු සංචිත සහතිකපත් දරු ප්‍රමාණය රුපියල් දශලක්ෂ 10 කින් පහත වැටිණි.

1976 අංක 37 දරන විසර්ජණ පනත යටතේ 1977 වසරේ නිකුත් කරන ලද සියළුම රුපියල් සුරැකුම් අවුරුදු 10—12 දක්වා කාලපරිච්ඡේදයකින් කල්පිරෙන ඒවා විය. 1977 ජනවාරි සිට ජූලි කාලච්ඡේදය තුල නිකුත් කළ රුපියල් දශලක්ෂ 1,100 ක ණය ප්‍රමාණය සියයට 9 වාර්ෂික පොලියකට හිමිකම් පෑවේය. ඉතිරි රුපියල් දශලක්ෂ 400 ක ණය ප්‍රමාණය, වසරේ ඉතිරි කාලය තුලදීනිකුත් කරන ලද්දේ ඊට වඩා වැඩිවූ එනම් සියයට 10 ක පොලියකුත් සමගය.

1977 වසරේ විදේශීය ණය පිළිබඳ වගකීම රුපියල් දශලක්ෂ 5,859 කින් ඉහළ ගියේය. රුපියලේ විනිමය අනුපාතිකයේ වෙනස්වීම සහ අනෙකුත් අදල විදේශීය මුදල්වල අනුපාතික උස් පහත් වීම් යන හේතූන් නිසා ඇතිවූ රුපියල් දශලක්ෂ 4,849 ක ණය වටිනාකමෙහි පොත් ගැළපීම නියෝජනය කරයි. ඒ අනුව සම්පත් වල ශුද්ධ පැවරුම රුපියල් දශලක්ෂ 1,010 ක් විය.

මුළු ණය ප්‍රමාණයෙන් විදේශීය ණය හිමිකරගන්නා ප්‍රතිශතය 1975 දී පැවති සියයට 25 සිට 1977 දී සියයට 43 දක්වා ඉහළ ගියේය. 1977 වසර තුලදී වූ මෙකී වෙනස්වීමට විශාල වශයෙන් සාධක වූයේ නොවැම්බර් මාසයේ සිට බලපවත්නා ලද විනිමය අනුපාතිකය ඒකීය කිරීම සහ අනෙකුත් විදේශ මුදල් වල වටිනාකමේ වූ උස් පහත් වීමය. මෙම උච්චාවචනය අත්හල විට 1975 වසරේ සියයට 23 ප්‍රමාණයේ තිබූ විදේශීය ණය වගකීම 1977 වනවිට සියයට 30 දක්වා ඉහළයෑමෙන් ප්‍රකාශ වන්නේ ශ්‍රී ලංකාවේ සංවර්ධන සැලසුම් සඳහා විදේශීය සම්පත් පිටිවහල් කරගන්නා පරිමාණය හා ඒ කෙරේ ඇති විශාල බැඳීමයි.

1977 වසරේ විදේශීය ණයෙහි දළ ලැබීම රුපියල් දශලක්ෂ 1,444 ක්[1] වූ අතර සැලකිය යුතු දායකයන් ලෙස එක්සත් රාජධානිය (රුපියල් දශලක්ෂ 294 ක්) ඇමරිකා එක්සත් ජනපදය (රුපියල් දශලක්ෂ 272 ක්) ජාත්‍යන්තර සංවර්ධන සංගමය (රුපියල් දශලක්ෂ 120 ක්) ආසියානු සංවර්ධන බැංකුව (රුපියල් දශලක්ෂ 100 ක්) ජපානය (රුපියල් දශලක්ෂ 99 ක්) ඉන්දියාව (රුපියල් දශලක්ෂ 75 ක්) සහ ජර්මන් ෆෙඩරල් ජනරජය ද (රුපියල් දශලක්ෂ 70 ක්) පිළිබිඹු වේ. 1977 වර්ෂයේ දී විදේශීය ණය රුපියල් දශලක්ෂ 434 ක් ආපසු ගෙවා ඇත.

පසුගිය වසර කිහිපය මුළුල්ලේම ලැබුණු යහපත් අපනයන ආදායම, 1975 දී සියයට 23 ක්වූ විදේශීය ණය සේවා අනුපාතය (විදේශීය ණය සේවාකරණය භාණ්ඩ හා සාධක නොවන සේවා නිර්යාතයන්ගේ අනුපාතයන් වශයෙන්) 1976 දී සියයට 20 තෙක් ද, 1977 දී සියයට 19 තෙක් ද ක්‍රමයෙන් පහත හෙළීමට සමත් වී ඇත. මේ අතරතුර දේශීය ණය සේවා අනුපාතය (රජයේ ආදායමේ අනුපාතයක් හැටියට ණය සේවා කරණය) පසුගිය දශකය හා ඊට පෙර සමයේ පටන් ඉහල යෑමේ උපනතියක් පෙන්නුම් කර ඇත. එය 1977 දී සියයට 5 කින් එනම් සියයට 17 දක්වා ඉහල ගියේය. ණය බර, පාලනය කළ හැකි මට්ටමක රඳවා ගැනීමට රජය අපේක්ෂා කරන්නේ නම් පොදු ආයෝජනයන්ගේ ගුණය ඉහළ නැංවීම ඉතාමත් යෝග්‍ය වේ.

1. වාර්තා කිරීමේ අඩුලුහුඩු කම සහ වර්ගීකරණය කිරීමේදී ඇති වූ වෙනස්කම් කම් නිසා, අයවැය හිඟය පියවීම යටතේ පෙන්වා ඇති අනුරූප අගය වූ රුපියල් දශලක්ෂ ~~1,312~~ 1,253 න් මෙම අගය වෙනස් වෙයි.